Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 06

විෂය:- නර්තනය

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

## භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය

ජීවිතයේ විවිධ අවස්ථා අනුව ඇති වන සිතිවිලි විවිධාකාර ය. එම සිතිවිලි ක්ෂණයෙන් වෙනස් වේ. ඊට අනුරූපී ව අංග - ප්‍රත්‍යංග - උපාංගවල ස්වභාවය ද වෙනස් වේ. "අඩවන් වූ දෙනෙතින් ගලනා ගමන් මුදිතා කරුණා ධාරා" වැනි ගීත ශ්‍රවණය කිරීමෙන් ඔබගේ සිත තුළ පහළ වන හැඟීම් කෙසේ ද යන්න සිහියට නඟා ගත හැකි ය. එම හැඟීමත් සමඟ ම මුහුණෙහි අංග - ප්‍රත්‍යංගවල හා උපාංගවල වෙනස්කමක් ඇති වන්නේ ද යන්න පිළිබඳ ව ස්වයං අධ්‍යයනයක යෙදෙන්න.

- **ශාන්ත (ශම) ස්ථායී භාවයෙහි දී මුහුණෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ :**
    - ඇස් අඩවන් වීම
    - එක ඉරියව්වක පිහිටීම



- **ශාන්ත (ශම) භාවය ප්‍රදර්ශනය කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් සඳහා උදා :**
    - සෙමෙන් පියවර කීපයක් ඉදිරියට ගමන් කිරීම.
    - සංයමයෙන් යුතු ව විවිධ ඉරියවු අනුව වාඩිවීම.

ආගමික සිද්ධස්ථානයකට ප්‍රවේශ වූ මොහොතක ඉහත ක්‍රියාකාරකම් දැක ගත හැකි ය. ඉන් ප්‍රදර්ශනය වන්නේ ශාන්ත රසය යි. මෙහි දී ශරීරයේ ආභ්‍යන්තරික හැඟීම් අවදි වේ. එම හැඟීම් අප තුළින් ද ප්‍රදර්ශනය වේ. ශාන්ත (ශම) නැමැති ස්ථායි භාවය තේරුම් ගෙන මතුවන ශාන්ත රසය නිරූපණය කිරීම සඳහා පහත සඳහන් කෙටි සිද්ධිය ඇසුරු කර ගත හැකි ය.

### සිද්ධියක් ඇසුරෙන් ශාන්ත (ශම) භාවය අධ්‍යයනය කිරීම

වනයේ දින ගණනක් බඩගින්නේ වෙහෙස මහන්සියෙන් දඩයමේ යෙදෙන දඩයක්කාරයෙක් හදිසියේ ම විලක දිය බොමින් සිටින මුව රංචුවක් දකී. ක්ෂණයකින් මුව රංචුව කලබල වේ. එක් මුවකු පසුපස හඹා ගොස් විදීමට සැරසෙන විට ම, එම විලට පැන් ගෙන ඒමට පැමිණි තාපසයකු දැක දුනු හී බිම දමා වැඳ නමස්කාර කරයි. දඩයක්කරු තාපසයා පසු පස ගමන් කරයි. අසපුවට ගිය තාපසයා සත්ත්ව හිංසනයේ ආදීනව පැහැදිලි කරයි.

### තේමාවක් අනුව චරිත නිරූපණය කිරීම.

පහත සඳහන් සිද්ධිය පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.

හංසයන් රඟන විලක මල් නෙළමින් ප්‍රීති වන කුමාරිකාවෝ පිරිසකි. හදිසියේ ම විලෙන් දිය රකුසෙක් මතු වෙයි. ඔවුහු භීතියෙන් කෑ ගසමින් විල අසල ඇති ගුහාවක් තුළට දිව යති. ක්‍රමයෙන් අඳුර වැටෙත් ම ගුහාවෙන් එළියට පැමිණි ඔවුහු කැලයේ මං මුළා වෙති. අනතුරු ව කැලයේ ඒ මේ අත ඇවිද, මහා රුක්ස ගසක් මුලට වී දෙවියන් යදිති. ගසෙහි සිටි වෘක්ෂ දේවතාවියක දුටු කුමාරිකාවෝ කැලයෙන් එළියට ඒමට ඇයගේ සරණ පතති. ටික වේලාවකින් පන්දම් ආලෝකයකින් ගම් වැසියකු එනු දුක ඔහුගේ ආධාරයෙන් කැලයෙන් එළියට පැමිණෙති.

සිද්ධිය හා සබැඳි චරිත :
කුමාරිකාවෝ, දිය රකුසා
හංසයෝ, ගම් වැසියා

**නර්තනය මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු :**

මෙහි දී මෙම චරිතවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් චලන නිර්මාණය කළ හැකි ය.

කුමාරිකාවන්ගේ චරිත නිරූපණය කිරීමේ දී යොදා ගනු ලබන චලනවල ලාස්‍ය බව මතුවිය යුතු ය. උපාංගවල පිබිදීමක් තිබිය යුතු යි. ජල ක්‍රීඩා කිරීම, මල් නෙළීම ආදිය ඉදිරිපත් කිරීමේ දී චරිත විකාශය කිරීමට සුදුසු චලන භාවිතය අවශ්‍ය වේ.

නෙතග බැල්ම, මන්දහාසය, කෝමල බව එම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමේ දී යොදා ගැනීමෙන් ඉහත ශෘංගාරාත්මක ලක්ෂණ උද්දීපනය වෙයි.

දිය රකුසාගේ චරිතය තුළ තාණ්ඩා ගුණය හා රෞද්‍ර භාවය මතු වෙයි. හංසයන්ගේ චරිත නිරූපණයේ දී සැහැල්ලු, පා වෙනසුලු චලන යොදා ගැනීම උචිත වන අතර, විවිධ තල භාවිත කරමින් කරනු ලබන චලන හා ඉරියවු යොදා ගත හැකි ය.

ක්‍රියාකාරකම් උදා :
අක්ෂි චලන/හස්ත චලන
භාව ප්‍රකාශනය
ඇඟිලි තුඩුවලින් ඉස්සීම
ඇඟිලි තුඩුවලින් ඇවිදීම
බිම වැතිරීම
ඉඳ ගැනීම ආදිය

- **හිස්තැනට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. පංති කාමරයේ මේසයක් ඇසුරින් චරිත නිරූපණය කිරීමේදී අවධානය යොමු කළ යුතු අංගයකි, ..........

    (1). භාව නිරූපණය　　(3). අංග රචනය

    (2). රංග වස්ත්‍රාභරණ　　(4). පසුතල

02. වචන මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශනය .............. අභිනය ලෙස හැඳින්වේ.

    (1). ලිඛිත　(2). භාෂික　(3). වාචික　(4). ජාතික

03. කාන්තා චරිත නිරූපණයේ දී .............. බව මතු විය යුතුය.

    (1). තාණ්ඩව　(2). අඛණ්ඩව　(3). ග්‍රාම්‍ය　(4). ලාස්‍ය

04. "ශාන්ත" නමැති ස්ථායී භාවය නිරූපණයේදී මුහුණෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි, ..............

    (1). ඇස් අඩවන් වීම　　(3). ඇස් මලානික වීම

    (2). ඇස් විශාල වීම　　(4). ඇස් දුරුවර්ණ වීම

05. මුහුණෙහි වැඩි වශයෙන් ඇත්තේ .............. යන් ය.

    (1). අංග　(2). උපාංග　(3). ප්‍රත්‍යංග　(4). පාදාංග

(ලකුණු 2×5 - 10)

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. "ශාන්ත" භාවයෙන් උපදින රසය කුමක්ද? (ලකුණු 05)
02. "ශාන්ත" භාවය පැහැදිලිව හඳුනාගත හැකි අවස්ථාවක් සඳහන් කරන්න. (ලකුණු 05)
03. භාව නිරූපණයේ දී ශරීරය බෙදා දක්වෙන කොටස් තුන කුමක්ද? (ලකුණු 10)
04. ශාන්තභාවය නිරූපණයේදී මුහුණෙහි ඇති වන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 10)
05. ශාන්තභාවය ප්‍රදර්ශනය කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් 2ක් දක්වන්න. (ලකුණු 10)
06. ශාන්තභාවය නිරූපණය කළ හැකි සිද්ධියක් ගොඩ නගන්න. (ලකුණු 10)

## ඉගෙනුම් ආධාරක

https://www.youtube.com/watch?v=vk7kpAbXTt8&t=166s

https://www.youtube.com/watch?v=OVv1XK_42Lo